එකම වරදක් සඳහා කාන්තා සහ පිරිමි දෙපාර්ශවයම සහභාගී වූ විටකදී පවා, කාන්තාව පමණක් ඉස්මතු කිරීම ඇතැම් මාධ්‍ය මගින් සිදුකරයි.
එසේ කරන මාධ්‍ය අපට හැඟවීමට තැත් කරන්නේ, ස්ත්‍රී පුරුෂ දෙපාර්ශවයම සහභාගී වී සිදු වන වරදකදී වුවද, එම වරද සම්බන්ධයෙන් කාන්තාවට වඩා වැඩි වගකීමක් පැවරෙන බව දැයි පාඨක අප ඇසිය යුතු වේ.
තිනකරන්, තිනකුරල් සහ, වීරකේසරී පුවත් වාර්තාවන් කිහිපයක් තුළ මෙසේ කාන්තාව පමණක් සෘණාත්මකව ඉස්මතු වී තිබූ ආකාරයන් මේ සඳහා නිදසුන් ලෙස පෙන්වා දිය හැක. එම පුවත් සිරස්තල පහත දැක්වේ.
ඔබ සිතන ලෙසට,
1) එකම වරදක් සම්බන්ධයෙන් කාන්තාව පමණක් මාධ්‍ය විසින් ඉස්මතු කොට දැක්වීම, ස්ත්‍රී පුරුෂ භාවය පදනම් කරගනිමින් කාන්තාව කොන් කිරීමක් නොවන්නේ ද?
2) එය ආචාර ධාර්මික මාධ්‍යකරණයෙන් පිට පැනීමක් නොවේ ද?
**Ethics Eye නිරීක්ෂකයෙකු වීමට ඔබත් කැමතිද? එසේ නම්, ඔබ හඳුනාගන්නා මාධ්‍ය ආචාර ධර්ම කඩ කිරීම් අප වෙත එවන්න.
*අපගේ නිරීක්ෂණයන් WhatsApp ඔස්සේ නොමිලේ ලබා ගන්න! ඔබගේ නම සහ WhatsApp අංකය සෘජු පණිවිඩයක් (DM/inbox) හරහා අප වෙත එවා, දැන්ම Ethics Eye subscriber කෙනෙකු වන්න!

# ඍණාත්මක සන්දර්භයන් තුළ කාන්තාවන් පමණක් ඉස්මතු නොකරමු!

ETHICS EYE

நடமாடும் விபச்சார விடுதி;

**சுற்றிவளைப்பில் 04 இளம் பெண்கள் உட்பட ஏழு பேர் கைது**

ජංගම ගණිකා මඩම;
පොලිස් වැටලීමකදී කාන්තාවන් 4ක් ඇතුළු හත් දෙනෙකු අත්අඩංගුවට

තිනකරන්
தினகரன்
2023-05-24

---

**பொலிஸ் உத்தியோகத்தர் மீது தாக்குதல்;**
**பெண் உட்பட 3 சந்தேகநபர்கள் கைது**

පොලිස් නිලධාරියෙකුට පහර දීම;
කාන්තාවක් ඇතුළු සැකකරුවන් 3ක් අත්අඩංගුවට

තිනකුරල්
தினக்குரல்
2023-05-26

---

**பெண் உட்பட மூவர் கைது**

කාන්තාවක් ඇතුළු තිදෙනෙක් අත්අඩංගුවට

වීරකේසරී
வீரகேசரி
2023-05-26